# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/9/2018 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2018.05.01 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) **05-2018**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්
හා ගණන් දීමේ නිලධාරීන් වෙත.

**<u>ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයට ගෙවිය යුතු වාර්ෂික සාමාජික දායකත්ව ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 264/2018 හා 2018.03.09 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

02.එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/06/3/8 හා 2018.04.17 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03.රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 264/2018 අනුව මේ වන විට, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ වෘත්තිය සාමාජිකත්වය අවස්ථා 03ක් යටතේ ශ්‍රේණිගතව පවතින අතර 2018.01.01 දිනට බලපැවැත්වෙන එහි වාර්ෂික දායකත්වයන් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය (APFA) | රු. 1,000 |
| රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ අධි සාමාජිකත්වය (FPFA) | රු. 1,200 |
| වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සාමාජිකත්වය (CPFA) | රු. 10,000 |

04.එමගින් වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ සාමාජිකත්වය, සුදුසුකම්ලත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ට පිරිනමන බැවින් වෘත්තීමය සංවර්ධනය තුළින් ලබාගත් දැනුම රාජ්‍ය නිලධාරීන් වශයෙන් ඔවුන්ගේ රාජකාරී කටයුතු සාර්ථකව ඉටුකිරීමට ඉවහල් වන බවත් සාමාජිකයන් විසින් මෙම එක් වෘත්තීමය සාමාජිකත්වයක් වෙනුවෙන් වාර්ෂිකව ගෙවිය යුතු සාමාජික මුදල් එම සාමාජිකයන් සේවය කරනු ලබන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දැරීම හෝ ප්‍රතිපූර්ණය කිරීම කළ හැකි බව දන්වා ඇත.

05. මෙම උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙන අතර මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්: 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02.අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No:

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2018.03.09

**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක -: 264/2018**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයට ගෙවිය යුතු වාර්ෂික සාමාජික දායකත්ව ගාස්තු ප්‍රතිපූරණය කිරීම**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරුවන්ගේ වෘත්තිය අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් එහි රාජ්‍ය අංශ ඒකකය ලෙස රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය 2012 වසරේදී ස්ථාපිත කරන ලදී. මෙම සංගමය විගණකාධිපති, රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ඇතුළු 12 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලබයි.

02. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් එක්සත් රාජධානියේ වරලත් රාජ්‍ය මූල්‍ය සහ ගණකාධිකරණ ආයතනය සමඟ එක්ව 2015 වසරේ සිට වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ සුදුසුකම පිරිනැමීම සඳහා අවශ්‍ය පරීක්ෂණයන් පැවැත්වීම ආරම්භ කර ඇත. එහි මූලික පියවරක් ලෙස මූල්‍ය කළමනාකරණ විෂය සහිතව ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි සුදුසුකම හෝ එයට සමාන හෝ ඉහළ සුදුසුකම් සහිතව කුසලතා පදනම මත තෝරාගත් දීපව්‍යාප්ත සේවාවල නියුතු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, විගණන සේවයේ, දේශීය ආදායම් සේවයේ සහ සුදුසුකම් ලත් අනෙකුත් රාජ්‍ය නිලධාරීන් හට මෙම සුදුසුකම පිරිනමන ලදී. දැනට සාමාජිකයන් 135 දෙනෙකු වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ සුදුසුකම ලබාගෙන ඇත.

03. මේ වන විට, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ වෘත්තිය සාමාජිකත්වය අවස්ථා 03 ක් යටතේ ශ්‍රේණිගතව පවතින අතර 2018.01.01 දිනට බලපැවැත්වෙන එහි වාර්ෂික දායකත්වයන් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය (APFA) | රු. 1,000 |
| රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ අධි සාමාජිකත්වය (FPFA) | රු. 1,200 |
| වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සාමාජිකත්වය (CPFA) | රු. 10,000 |

04. වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ සාමාජිකත්වය, සුදුසුකම්ලත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ට පිරිනමන බැවින් වෘත්තීමය සංවර්ධනය තුළින් ලබාගත් දැනුම රාජ්‍ය නිලධාරීන් වශයෙන් ඔවුන්ගේ රාජකාරි කටයුතු සාර්ථකව ඉටුකිරීමට ඉවහල් වේ. සාමාජිකයන් විසින් මෙම එක් වෘත්තීමය සාමාජිකත්වයක් වෙනුවෙන් වාර්ෂිකව ගෙවිය යුතු සාමාජික මුදල් එම සාමාජිකයන් සේවය කරනු ලබන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දැරීම හෝ ප්‍රතිපූරණය කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ විරුද්ධත්වයක් නොමැත.

05. මෙම සංගමය විසින් රාජ්‍ය අංශයේ සාමාජිකයන්ට සංගමය විසින් සපයනු ලබන සේවාවන් තුළින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට පහසුකම් සලසන මෙන් ද මේ මගින් ඉල්ලා සිටිනු ලැබේ..

06. 2009.02.10 දිනැති SA/AS/DG/1 දරණ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලිපිය මෙම චක්‍රලේඛ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අවලංගු වේ.

07. මෙම චක්‍රලේඛයේ සඳහන් තොරතුරු සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලිකිරීමක් අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් (දු.ක.0112484728, ෆැක්ස් - 0112473856) ඇමතීමෙන් ලබාගත හැක.

**ආර්.එච්.එස්. සමරතුංග**

**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1. විගණකාධිපති